# ඉතිහාසය

## අ.පො.ස. (උ/පෙළ)



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## 07. පශ්චාත් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය

මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භය අතර සියවස් තුනක් පමණ කාලයක් තුළදී දේශීය හා විදේශීය රාජවංශ කිහිපයක්ම එකිනෙකා පරයමින් බලය අත්පත් කරගැනීමේ අරගලයක නිරත වී තිබේ. එවකට පැවති අස්ථාවර දේශපාලන වටපිටාව මෙවැනි වාතාවරණයක් ගොඩනැඟීමට බලපෑ ප්‍රධානම හේතුවයි.

මේ කාලයේදී ඉන්දු ග්‍රීක (යවන), පාතියන්වරු (පහ්ලව), ශක (සිතියන්), කුෂාණ යන විදේශීය ජාතීන් වයඹදිග ඉන්දියාවේ කලින් කලට බලය පිහිටුවාගෙන තිබේ. එමෙන්ම දේශීය රාජවංශ ලෙස සැලකෙන ශුංග රාජවංශය

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| **ඉන්දු ග්‍රීකයන් (යවන)** | • බැක්ට්‍රියාවේ හා ඉන්දු නදියෙන් බටහිර ප්‍රදේශවල විසූ ග්‍රීක අධිපතීන් **ඉන්දු ග්‍රීක** නමින් හඳුන්වා තිබේ.<br>• ඛයිබර් දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණීම. | **ඩිමිට්‍රියස් රජතුමා** | • පංචාල හා සාගල අල්ලා ගැනීම. |
| | | **මිනැන්ඩර් රජතුමා (මිලින්ද)** | • සාගල අගනුවර වීම. වර්තමාන සියල්කෝට් වීම.<br>• ගංගා නම් නදියේ සිට ඔක්සස් නදී නිම්නය දක්වාත්, හිමාලයේ සිට නර්මදා නදිය දක්වාත් බලය පැතිරවීම.<br>• පංජාබ්, පෙෂාවෝර්, කාබුල්, තක්ෂිලා සහ බ්‍රෝච් වරාය ඇතුළු ප්‍රදේශ රැසක් පාලනය කළ බවට තොරතුරු හමුවීම.<br>• සියල්කෝට් ලිපිය, බිජාපූර් අභිලේඛනය හා මිලින්ද රජුගේ කාසිවලින් තොරතුරු ලබාගත හැකිවීම.<br>• වැඩිම කාසි ප්‍රමාණයක් නිකුත් කළ ඉන්දු ග්‍රීක රජු වීම.<br>• බුදුදහමට අනුග්‍රහය දැක්වීම.<br>• මිලින්ද රජු හා නාගසේන නම් භික්ෂුවක් අතර ඇතිවූ ආගමික වාදය 'මිලින්ද ප්‍රශ්නය' කෘතියට පදනම් වීම.<br>• ඉන්දු ග්‍රීක පෙළපතේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකේ. |
| | | **හර්මයියොස් රජතුමා** | • ඉන්දු ග්‍රීක පෙළපතේ අතර අවසාන පාලකයා වීම. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| **ශකවරු (සිතියන්)** | • මධ්‍ය ආසියාවේ සිට පැමිණි පිරිසකි.<br>• ක්‍රි.ව. 1 හා 2 සියවස් වල බෝලාන් දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණීම.<br>• ක්‍රි.ව. පළමු හා දෙවන සියවස් වල වයඹදිග ඉන්දියාවේ බලය පැතිරවීම.<br>• ශකවරුන් සිය පාලන ප්‍රදේශ **ශත්‍රප** නම් පාලන ඒකකවලට බෙදා පාලනය කිරීම.<br>• ඉන්දියාවේ බලය අත්පත් කරගත් ශකවරුන්ගේ මධ්‍යස්ථාන හතරකි:<br>* තක්ෂිලා<br>* මථුරා<br>* උජ්ජේනි<br>* මහාරාෂ්ට්‍ර | **මාවුස් රජතුමා (මෝස)** | • තක්ෂිලාව මුල්කර ගනිමින් පාලන කටයුතු ගෙනයාම.<br>• පංජාබ්, ගන්ධාර, මථුරා ඇතුළු ප්‍රදේශ රැසක බලය පැතිරවීම.<br>• තක්ෂිලා ලිපිය හා කාසිවලින් තොරතුරු අනාවරණය වීම.<br>• මහා රාජාධිරාජ විරුදය දැරීම. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| **ශකවරු (සිතියන්)** | • මධ්‍ය ආසියාවේ සිට පැමිණි පිරිසකි.<br>• බෝලාන් දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණීම.<br>• ක්‍රි.ව. පළමු හා දෙවන සියවස් වල වයඹදිග ඉන්දියාවේ බලය පැතිරවීම.<br>• ශකවරුන් සිය පාලන ප්‍රදේශ **ශත්‍රප** නම් පාලන ඒකකවලට බෙදා පාලනය කිරීම.<br>• ඉන්දියාවේ බලය අත්පත් කරගත් ශකවරුන්ගේ මධ්‍යස්ථාන හතරකි:<br>* තක්ෂිලා<br>* මථුරා<br>* උජ්ජේනි<br>* මහාරාෂ්ට්‍ර<br>• ශක වර්ෂ ක්‍රමය ආරම්භ කිරීම. | **මාවුස් රජතුමා (මෝස)** | • තක්ෂිලාව මුල්කර ගනිමින් පාලන කටයුතු ගෙනයාම.<br>• පංජාබ්, ගන්ධාර, මථුරා ඇතුළු ප්‍රදේශ රැසක බලය පැතිරවීම.<br>• තක්ෂිලා ලිපිය හා කාසිවලින් තොරතුරු අනාවරණය වීම.<br>• මහා රාජාධිරාජ විරුදය දැරීම. |
| | | **නහපාන රජතුමා** | • පූනා සිට මාල්වා දක්වා බලය ව්‍යාප්ත කිරීම.<br>• නහපාන රජුට බලය ව්‍යාප්ත කිරීමේදී සාතවාහනයන් සමඟ ගැටුම් ඇතිකර ගැනීමට සිදුවීම. |
| | | **චෂ්ටන රජතුමා** | • උජ්ජේනිය මුල් කරගනිමින් පාලන කටයුතු ගෙනයාම. |
| | | **මහා ක්ෂත්‍රප රුද්‍රදාමන් රජතුමා** | • පාලකයෙකු විසින් පිහිටුවන ලද ප්‍රථම රාජකීය සංස්කෘත අභිලේඛනය වන **ජුනාගාඞ්** ශිලා ලිපිය මේ රජු විසින් පිහිටුවා තිබේ.<br>• රුද්‍රදාමන් රජු සාතවාහන දෙවරක් පරාජය කළ බව **ජුනාගාඞ්** ලිපියේ සඳහන් වේ.<br>• මාල්වා, කතියාකාර්, ගුජරාට්, උතුරු කොන්කන් හා සින්ධු නිම්නය දක්වා බලය පැතිරවීම.<br>• රුද්‍රදාමන් රජු ශක පෙළපතේ ශ්‍රේෂ්ඨතම පාලකයා වීම. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| **පාතියන්වරු (පහ්ලව)** | • ක්‍රි.ව. පළමු වැනි සියවස වන විට ශකවරුන් පරදා තක්ෂිලාව මුල් කරගනිමින් පාතියන්වරු රාජ්‍යයක් පිහිටුවීම. | **ගොන්ඩොපර්නිස් රජතුමා** | • වයඹදිග ඉන්දියාවේ බලය ව්‍යාප්ත කළ ප්‍රථම පාතියන් පාලකයාය.<br>• මේ රජුගෙන් පසුව පාතියන් රාජ්‍ය දුර්වල වූ අතර කුෂාණයන් විසින් එම ප්‍රදේශ අත්පත් කරගෙන තිබේ. |
| **කුෂාණවරු** | • චීන තුර්කිස්ථාන ප්‍රදේශය නිජබිම කරගත් යු-ඒ-චී නම් එඬේර ගෝත්‍රයට අයත් පිරිසකි.<br>• විදේශීය වුණු ජන කණ්ඩායමක් වුව ද ඉන්දුයානු සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දක්වා තිබේ. | **කුජුල කැඩ්පයිසිස් රජතුමා** | • වයඹදිග ඉන්දියාව අල්ලා ගැනීම. |
| | | **හිමකැඩ්පයිසිස් රජතුමා** | • තක්ෂිලාව හා පංජාබය අල්ලා ගැනීම.<br>• සර්වලෝක ඊශ්වර, මහේෂ්වර යන විරුදයන් භාවිත කිරීම. |
| | | **කණිෂ්ක රජතුමා** | • පුරුෂපුරය අගනුවර කර ගනිමින් වයඹදිග ඉන්දියාවේ අධිරාජ්‍යයක් ගොඩනැඟීම.<br>• කාශ්මීරය, රාජ්පුතානා, මාල්වා, උත්තර ප්‍රදේශ, ශ්‍රාවස්ති, කතියාවාර් ප්‍රදේශය, නැගෙනහිර ඉන්දියාවේ බෙංගාලය, ඔරිස්සා, බිහාර්, නේපාලය, බරණැස දක්වාත්, මධ්‍ය ආසියාවේ යාර්කන්ඩ්, කැෂ්ගාර්, ඛෝටාන් දක්වාත් බටහිර ඉන්දියාවේ බලය පිහිටුවීම.<br>• ඉන්දියාවේ හා ඉන් බැහැර ප්‍රදේශද එක් කරමින් විශාල අධිරාජ්‍යයක් ගොඩනැඟීම.<br>• බුදුදහමට අනුග්‍රහය දැක්වීම.<br>* සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම.<br>* මහායාන බුදුදහමේ වර්ධනයක් ඇතිවීම.<br>* මහායාන බුදුදහම මධ්‍ය ආසියාව වැනි ඉන්දියාවෙන් බැහැර ප්‍රදේශවලට ව්‍යාප්ත වීම. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| | | **කණිෂ්ක රජතුමා** | • ගාන්ධාර කලාවේ දියුණුවක් ඇතිවීම.<br>• මථුරා කලාව දියුණුවට පත්වීම.<br>• සංස්කෘත භාෂාවේ විශාල දියුණුවක් ඇතිවීම.<br>• ප්‍රථම වතාවට බුද්ධ ප්‍රතිමා නිර්මාණය වීම.<br>• ශක රාජවර්ෂ ක්‍රමය ආරම්භ වීම.<br>• ඉන්දීය සංස්කෘතිය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත වීම (චීනය දක්වා).<br>• කණිෂ්ක රජු පිළිබඳව තොරතුරු ලබාගැනීමට **රබාතක් ලිපිය, මනික්යාල ලිපිය, සූයි විහාර තඹ තහඩු ලිපිය, පාහියන් වාර්තා, හියුං සියැං වාර්තා,** පුරාවිද්‍යා මූලාශ්‍ර උපයෝගී කර ගැනීමට හැකිවීම. |
| | | හුවිෂ්ක රජතුමා | • කනිෂ්ක රජතුමා කුෂාණ පෙළපතේ ශ්‍රේෂ්ඨතම පාලකයා වීම. |
| | | වාසුදේව රජතුමා | • කාෂ්මීරයේ හුවිෂ්ක පුර නම් බෞද්ධ මධ්‍යස්ථානයක් කරවීම.<br>• අවසාන කුෂාණ පාලකයාය. |
| ශුංග පෙළපත | • මෞර්යයන්ගෙන් පසුව මගධයේ බලය පිහිටුවා ගත් රජ පෙළපත ශුංගයන්ය.<br>• දේශීය පෙළපතකට අයත් රාජවංශයකි. | පුෂ්‍යමිත්‍ර ශුංග රජතුමා | • මෞර්ය අධිරාජ්‍යයේ අවසාන පාලකයා වූ බෘහද්‍රථ ඝාතනය කොට මෞර්ය බලය අත්පත් කරගනිමින් නව රජවංශයක් බිහිකිරීම.<br>• පාටලීපුත්‍රය අගනගරය කරගනිමින් පාලන කටයුතු මෙහෙයවීම.<br>• වයඹදිග ජලන්දර්, සාගල, සියාල්කෝට් සහ ඩෙකැන් ප්‍රදේශය යටත් කිරීම.<br>• ග්‍රීක ආක්‍රමණිකයෙකු පලවා හැරීම.<br>• අශ්වමේධ යාග දෙකක් පැවැත්වීම.<br>• සාංචි, භාර්හුත්, බුද්ධගයා ආදී ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම නිසා බුදුදහමට අනුග්‍රහ දැක්වූ බව හෙළිවීම. |
| | | අග්නිමිත්‍ර | • කාළිදාසයන්ගේ මාලවිකාග්නිමිත්‍රයේ කතානායකයාය. |
| | | දේවභූති (දේවභූමි) | • ශුංග පෙළපතේ අවසාන පාලකයාය. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රාජ වංශය | රාජවංශය පිළිබඳ වැදගත් තොරතුරු | කැපී පෙනෙන පාලකයන් | වැදගත් තොරතුරු |
|---|---|---|---|
| **සාතවාහන (ආන්ධ්‍ර)** | • දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණා, ගෝදාවරී හා නර්මදා ගංගා අතර ප්‍රදේශයේ සාතවාහන බලය පැතිර වීම.<br>• ප්‍රතිෂ්ඨාන හෙවත් පයිතාන් නමින් පාලන මධ්‍යස්ථානය වීම.<br>• වින්ධ්‍යා කඳු වැටියෙන් පහළ ඉහළ ඩෙකෑන් ප්‍රදේශයේ බිහිවූ විශාලතම හා පළමු අධිරාජ්‍යය වීම. | සිමුඛ රජු | • ඩෙකෑනයේ නව රාජවංශයක් ගොඩනැගූ ප්‍රථම සාතවාහන රජු වීම. |
| | | පළමු සාතකර්ණී රජතුමා | • බටහිර, මධ්‍යම හා උතුරු ඩෙකෑනයේ බලය ව්‍යාප්ත කිරීම.<br>• දක්ෂිණපථපති යන විරුද නාමය භාවිත කිරීම.<br>• අශ්වමේධ යාග දෙකක් පැවැත්වීම. |
| | | ගෞතමීපුත්‍ර සාතකර්ණී රජතුමා | • ශක, යවන හා පාර්තිය බලය විනාශ කිරීමට කටයුතු කිරීම.<br>• උතුරින් මාල්වා හා කතියවාර් ප්‍රදේශවලින් බේ සිටි කොටසත්, දකුණින් ක්‍රිෂ්ණා සිට ගෝදාවරී තෙක් බලය ව්‍යාප්ත කිරීම.<br>• රාජ් රාජමහාරාජ් හා වර-වාරණ-වික්‍රම-චාරු වික්‍රම යන විරුද නාමයන් භාවිත කිරීම.<br>• නාසික් ලිපියෙහි මුහුදු රජු පිළිබඳව සඳහන් වීම. |
| | | ශිව ශානකර්ණී රජතුමා | • ශක ශෛලිය ඩෙකෑනයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම. |
| | | යඥ ශ්‍රී සාතකර්ණී රජතුමා | • සාතවාහන පෙළපතට අයත් අවසාන ශ්‍රේෂ්ඨ පාලකයාය.<br>• බටහිර ඉන්දියාවේ ක්ෂත්‍රපයන් සමඟ යුද්ධ කර, නර්මදා නිම්නය, රජ්පුතානා, සෞරාෂ්ට්‍ර මෙන්ම අනූප ආදී ප්‍රදේශවල බලය තහවුරු කරගැනීම.<br>• මෞර්යයන්ගෙන් පසුව බිහිවූ විශාලතම අධිරාජ්‍යය ගොඩනැගීම. |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk